# ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය

# මාධ්‍ය නිවේදනය

**ඩිජිටල් සංවර්තන විසඳුම් ක්‍රියාත්මක කිරීම සහ පරිමාණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය ඉන්දියානු රජයේ ඉලෙක්ට්‍රොනික් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය සමඟ අවබෝධතා ගිවිසුමකට එළැඹේ**

ඉන්දීය අග්‍රාමාත්‍ය අතිගරු ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ ශ්‍රී ලංකා නිල සංචාරය අතරතුර ඩිජිටල් පරිවර්තනය සඳහා සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමක් ඉන්දීය රජය සහ ශ්‍රී ලංකා රජය අතර අත්සන් කර 2025 අප්‍රේල් 5 දින හුවමාරු කරගන්නා ලදී.

“ඩිජිටල් සංවර්තනය සඳහා ජනගහන පරිමාණයෙන් ක්‍රියාත්මක කරන ලද සාර්ථක ඩිජිටල් විසඳුම් බෙදාහදා ගැනීමේ ක්ෂේත්‍රයේ සහයෝගීතාවය” යන මැයෙන් යුත් මෙම අවබෝධතා ගිවිසුමට ඉන්දීය රජයේ ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා සහ ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය වෙනුවෙන් එහි වැඩබලන ලේකම් වරුණ ශ්‍රී ධනපාල මහතා අත්සන් තබා ඇත. මෙය ප්‍රධාන වශයෙන් ධාරිතා වර්ධන වැඩසටහන් සහ දෙරට අතර සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සහ ඔවුන්ගේ ඩිජිටල් පරිසර පද්ධතීන්ට දායකත්වය ලබා දීම සඳහා නිර්මාණය කර ඇති අනෙකුත් සහයෝගී ක්‍රියාකාරකම් හරහා විෂයයට අදාළ පරිසර පද්ධති කේන්ද්‍ර කරගත් ඩිජිටල් මුලපිරීම් ක්ෂේත්‍රයේ සහයෝගීතාවන්ට පහසුකම් සපයනු ඇත.

දෙරටේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ නිලධාරීන් අතර ඒකාබද්ධ පුහුණු වැඩසටහන් හරහා ඩිජිටල් සංවර්තන කාර්යයන්හි නියැලි නිලධාරීන්ගේ ධාරිතා ගොඩනැගීම සහ එම අංශයේ වත්මන් වර්ධනයන් පිළිබඳ අධ්‍යයන චාරිකා, ද්‍රව්‍ය සහ තොරතුරු නිල වශයෙන් හුවමාරු කර ගැනීම, වඩාත් ප්‍රශස්ත භාවිතයන් හුවමාරු කර ගැනීම මෙම අවබෝධතා ගිවිසුමේ මූලික අවධානය යොමු කරන ක්ෂේත්‍ර වේ.

එක් එක් රටෙහි සාමාජිකයින් තිදෙනෙකුගෙන් බැගින් සමන්විත ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමක් විසින් මෙම අවබෝධතා ගිවිසුම වලංගුව පවතින ඉදිරි වසර තුනක කාලයක් සඳහා වූ සැලැස්ම නිර්ණය කරනු ලබන අතර, මෙම ගිවිසුමට සම්බන්ධ දෙපාර්ශ්වයටම අදාළ නීති, රීති සහ රෙගුලාසි සහ බහුපාර්ශ්වික ගිවිසුම්වලට අනුකූලව, අවබෝධතා ගිවිසුමට සම්බන්ධ මෙම සහයෝගීතාවය යටතේ ජනනය වන බුද්ධිමය දේපළවල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳව සහතික වේ.

මෙහි දී රාජ්‍ය නිලධාරීන්ගේ සහ අදාළ විෂය කරුණු පිළිබඳ විශේෂඥයින්ගේ උපදේශනය සක්‍රිය කරමින් ඩිජිටල් සංවර්තන විසඳුම් ක්‍රියාත්මක කිරීමේ සන්දර්භය තුළ ඉන්දියාව හා ශ්‍රී ලංකාව  යන දෙරටම ශක්‍යතා අධ්‍යයනයන් සහ ඩිජිටල්කරණ සේවා සඳහා සූදානම තක්සේරු කිරීම්හි නිරත වනු ඇත. ජනගහන පරිමාණයෙන් දැනටමත් ඔප්පු කර සාර්ථකව ක්‍රියාත්මක කර ඇති, නියමු හෝ ආදර්ශන ව්‍යාපෘති හරහා ක්‍රියාත්මක කරන ලද නව්‍ය ඩිජිටල් සංවර්තන විසඳුම් කිහිපයකට ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

2025 අප්‍රේල් 5 සෙනසුරාදා දින කොළඹ ජනාධිපති කාර්යාලයේ පැවති උත්සවයක දී මෙම අවබෝධතා ගිවිසුමේ අත්සන් කරන ලද පිටපත් ඉන්දීය විදේශ අමාත්‍යාංශයේ ලේකම් වික්‍රම් මිස්රි මහතා සහ ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ වැඩබලන ලේකම් වරුණ ශ්‍රී ධනපාල මහතා විසින් දෙරටේ නායකයින් ඉදිරියේ හුවමාරු කර ගන්නා ලදී.

(2025 අප්‍රේල් 7 දින, කොළඹ දී)